# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021
### 2024 නොවැම්බර් / දෙසැම්බර්

### මානවශාස්ත්‍ර පීඨය

### නාට්‍ය හා රංග කලාව
(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)

### ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව DMAT – E1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම දෙකක් තෝරාගෙන ඒවායේ දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. කොහොඹායක් කංකාරියෙහි භාවිත වන නාට්‍යමය උපක්‍රම උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 20)

03. අ) නාට්‍යමය ගුණය සහිත බෞද්ධාගමික වත්පිළිවෙත් 04 ක් නම් කරන්න. (ලකුණු 04)

    ආ) එම වත්පිළිවෙත්වල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

04. අ) සොකරි ගැමි නාටකයේ රඟ දැක්වෙන කතාපුවත සැකෙවින් ලියා දක්වන්න. (ලකුණු 06)

    ආ) සොකරි ගැමි නාටකයේ රංග ශෛලිය විමසුමට ලක් කරන්න. (ලකුණු 14)

05. අ) කෝලම් ගැමි නාටකයේ පූර්ව රංගයේ පිළිවෙළ ලියා දක්වන්න. (ලකුණු 06)

    ආ) "කෝලම් ගැමි නාටකය හුදු හාස්‍යයට පමණක් සීමා නොවූ රංග කාර්යයකි." මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 14)

06. නූර්ති ජනප්‍රිය කිරීමෙහි ලා ප්‍රාරම්භක නූර්ති නාට්‍යකරුවන්ගෙන් සිදු වූ සේවය අගය කරමින් පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 20)

07. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව තුළ සුවිශේෂී වන්නේ ඇයි දැයි ඔහුගේ නාට්‍ය කෘති දෙකක් (02) නිදසුන් ලෙස ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

08. රාජිත දිසානායකගේ සිහින හොරු අරං නාට්‍යය විචාරයට ලක් කරන්න. (ලකුණු 20)

********************************